# 2022 මැයි මස 23 වන දින පැවති යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු පිළිබඳ ස්ථාවර කමිටුව

**කමිටු සාමාජිකයන්**

| | | |
|---|---|---|
| 1. ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවිර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. කේ.පී.සචිනි නිමේෂා මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. ජී.ඒ.ශිවන්ත මලික් කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 5. එම්.එස්.එම්.අල් ෆාරිස් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 6. ජී.බී.නුවන් චතුරංග මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 1. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 2. කේ.පී.සචිනි නිමේෂා මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. ජී.ඒ.ශිවන්ත මලික් කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. එම්.එස්.එම්.අල් ෆාරිස් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

**නිලධාරී**

| | | |
|---|---|---|
| 1. ජයනි රාජකරුණා මිය | - | නාගරික ගණකාධිකාරී |
| 2. කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා | - | නාගරික ඉංජිනේරු |
| 3. එන්.පී.කේ.රණසිංහ මිය | - | පරිපාලන නිලධාරී |
| 4. එස්.එච්.එම්.පී.එම්.නවරත්න මිය | - | නියෝජ්‍ය පුස්තකාලයාධිපති |
| 5. ජී.වී.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා | - | ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක |
| 6. එස්.ඩබ්.නිශාන්ත සිල්වා මහතා | - | වැඩ අධිකාරී |
| 7. ටී.එල්.එස්.පීරිස් මිය | - | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී(මුදල්) |
| 8. පද්මා සෙනෙවිරත්න මිය | - | සැළසුම් අංශ ප්‍රධානී |
| 9. එම්.ඩී.පී.එච්.දිසානායක මිය | - | සංවර්ධන නිලධාරී |
| 10. ප්‍රගීත් ශ්‍රී ජයසුන්දර මහතා | - | සංවර්ධන නිලධාරී |
| 11. එච්.ආර්.බුද්ධික සම්පත් කරුණාතිලක මහතා | - | පරිගණක පුහුණු උපදේශක (වැ.බ.) |
| 12. ඩබ්.ඒ.ටී.එම්.වික්‍රමසිංහ මිය | - | පරිගණක පුහුණු උපදේශක (වැ.බ.) |
| 13. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය | - | විෂය ලිපිකරු |

1. නාගරික සංවර්ධන අධිකාරිය,නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැළසුම්),කේ.එම්.සේනාරත්න මහතා විසින් ලිපියක් යොමු කරමින් බැංකු පෙදෙස දුම්රිය රක්ෂිතය තුල දැනට පවත්වා ගෙන යනු ලබන පොදු වාහන නැවතුම් ස්ථානයට යාබඳ ඉඩම් කොටසේ වාහන නැවතුම් ස්ථානයක් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරිම යෝජිත ව්‍යාපෘතියක් බැවින් ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කිරිමට යොමු කිරිම.

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරිමට පෙර මහා නගර සභාවේ නිර්දේශයන්, අනුමැතිය හා නීතිරීතිවලට අනුගතව ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලෙස දන්වා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

2. අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට යෝජිත පහත සඳහන් නව සංවර්ධන ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරිම.

    1. කඩ පනහ වැව අවට භූ දර්ශනය.
    2. ඩඩ්ලි සේනානායක ළමා උද්‍යානය.
    3. කුම්බිච්චන්කුලම රළපනාව හා භූ දර්ශනය.

නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරි, මහා නගර සභාවේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නිලධාරි සහ මෙම කමිටු සාමාජික නාගරික මන්ත්‍රීවරු සමග අදාල ව්‍යාපෘති සම්බන්ධ කෙෂ්ත්‍ර පරික්ෂාවක් සිදු කර තීරණයක් ලබා ගැනිමට තීරණය කරන ලදි. (වගකිම - නාගරික ඉංජිනේරු)

3. සෑම කොට්ඨාශයකම පවතින අත්‍යාවශ්‍ය කාණු පද්ධති පිළිසකර කර දීම සඳහා සංවර්ධන කාර්ය උපරිම රු.50,000.00 ක යටත්ව සිදු කිරිමට සෑම කොට්ඨාශයකින්ම යෝජනා 2022.06.13 දිනට පෙර ලබාදීමට කටයුතු කරන ලෙස කොට්ඨාශ 14 වෙත දැනුම්දීමට තීරණය කර ඇත. (වගකිම - පරිපාලන නිලධාරි)

<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

1. නාගරික මන්ත්‍රී ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය විසින් ලිපියක් යොමු කරමින් මහින්ද විදුහල දෙසට ඇති මාර්ගයේ එක් පසක පමණක් වැසිජලය බැසයන කාණුව ඉදිකර ඇත. එහි අනෙත් පැත්තෙහි කාණුව ඉදිකර දෙන ලෙස කර ඇති ඉල්ලීම. ඇස්තමේන්තුවක් සකස් කර අනුමැතියට යොමු කිරිම.

ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවිර,
නාගරික මන්ත්‍රී /කමිටු සභාපති,
යටිතල පහසුකම්, නිවාස, පුස්තකාල තොරතුරු තාක්ෂණ හා
පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව,
අනුරාධපුර.